www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 18: • ආපදා කළමනාකරණය • ශබ්දකෝෂ පරිහරණය • තනි පද |
|---|---|---|

## I පත්‍රය

01. අකාරාදී පිළිවෙලට නම් යෙදී ඇති වරණය තෝරන්න.

    (1). නවීන්, නාලිකා, නුවන්, නෙතුක, නිම්සර

    (2). නවීන්, නාලිකා, නිම්සර, නෙතුක, නුවන්

    (3). නෙතුක, නුවන්, නිම්සර, නාලිකා, නවීන්

    (4). නවීන්, නාලිකා, නිම්සර, නුවන්, නෙතුක

02. සංචාරක ජීවිතයෙන් මිදී එක් තැනක වාසය කිරීම යන කොටසට ගැළපෙන තනි පදය වන්නේ,

    (1). සංචරතාව යි (2). ස්ථිරවාසිතාව යි (3). ගෘහවාසිතාව යි (4). වනවාසිතාව යි

03. සෑම අංගයන්ගෙන් සම්පූර්ණ වූ යන්නට දිය හැකි තනි පදයකි.

    (1). සර්වාංගසම්පූර්ණ (2). සර්වපූර්ණ (3). සර්වතෝභද්‍ර (4). සර්වසාධාරණ

04. ''ධර්මය දන්නා'' යන්නට යෙදිය හැකි තනි පදය වනුයේ,

    (1). ධාර්මික (2). ධර්මාන්විත (3). ධර්මධර (4). ධර්මානුකූල

05. අර්ථයෙන් එකිනෙකට වෙනස් පදයක් සහිත පද පේළිය තෝරන්න.

    (1). කෝලාහල - දබරය, කලකුරු - වෙහෙසීම, කලටි - නොමේරූ

    (2). කලවැල් - අගිල්, කලංක - කැලැල, කලගොණු - කලබලය

    (3). කලවිටි - කමත, කලහස් - කලු හස්න, කල්මි - මිහිකත

    (4). කලණ - කල්‍යාණ, කලත් - කැලඹුනු, කලරැවු - පරවියා

06. අකාරාදී පිළිවෙලට වචන යෙදී ඇති වරණය තෝරන්න.

    (1). තැඹිලි, තිරිසන්, තිසාවැව, ත්‍රස්තයා

    (2). පරිහානිය, පලිබෝධ, පඬිවරයා, පිළිවෙත්

    (3). කරහුම්, සුරසැප, ස්වස්තික, සීමාන්තික

    (4). සින්ධූපමාන, සිංහාසනය, සරතැස, සහශ්‍රය

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

# II පත්‍රය

01. පහත වචන යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

(i). ආරෝපණය
(ii). විසර්ජනය
(iii). බාදනය
(iv). වෝල්ටීයතාව
(v). භූ කම්පනය

02. පහත යෙදුම් සඳහා උචිත තනි වචන සොයා ලියන්න.

(i). මිහිරි ඝෝෂය ඇත්තා
(ii). රතු තුඩු හා පා ඇති හංසයා
(iii). ධාන්‍ය මඩින ස්ථානය
(iv). කමතෙහි කටයුතු කරවන්නා

03. පසුගිය දස අවුරුදු කාලයේ දී ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ ගංවතුර, නායයෑම්, සුනාමි වැනි භයානක ස්වභාවික අනතුරු වැඩිවෙමින් පවතින තත්ත්වයක් දැකිය හැකිය. හදිසි අවස්ථාවකට අප මුහුණදෙන ආකාරය සහ එයින් ආරක්ෂා වීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අප සියලු දෙනාම දැනුවත් ව සිටීම අත්‍යවශ්‍යය. ආපදා කළමනාකරණය යනු කුමක් ද යන්නත් ආපදාවක් මැනවින් කළමනාකරණය කර ගන්නේ කෙසේ ද යන්නත් පිළිබඳව කරුණු අන්තර්ගත කරමින් ''ආපදා කළමනාකරණයේ වැදගත්කම'' යන මැයෙන් රචනාවක් ලියන්න.

(ලකුණු 25)

Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!